# 19

# සූරාවන් 2



## සූරතුල් ඉහ්ලාස්, සූරතුල් ෆලක්, සූරතුන් නාස්

අල්කුර්ආනයේ අවසන් සූරාවන් තුන මෙම සූරාවන් ය. මේවා පාරායනයෙන් අධික ආනිශංස ලැබේ. සෑම සලාත අවසානයේ ම මෙම සූරාවන් පාරායනය කරන ලෙස නබි (සල්) තුමා අණ කළේ ය. උදේ සවස සහ බොහෝ සුන්නත් සලාතයන් අවසානයේ පාරායණය කරන සූරාවන් වේ. නබි(සල්)තුමා දිනපතා නිදා ගැනීමට මත්තෙන් මෙම සූරා තුන තෙවතාවක් පාරායණය කොට, තම දෑතේ අල්ලට පිඹ,

තමාගේ මුලු ශරීරය ම පිරිමදියි (බුහාරී) යනුවෙන් ආයිෂා (රළි) තුමිය දැනුම් දෙන්නී ය.

''මෙම රාත්‍රියේ පහළ වූ වාක්‍ය මෙන් මීට පෙර පහළවනු මා දැක නැත. ඒවා සූරතුල් ඉඛ්ලාස්, සූරතුල් ෆලක් සහ සූරතුන් නාස්, වේ'' යනුවෙන් නබි (සල්) තුමාණෝ පැවසූහ.

## සූරතුල් ඉඛ්ලාස්

අල් කුර්ආනයේ ඇතුළත් 112 වන සූරාව සූරතුල් ඉඛ්ලාස් වේ. මෙය වදන් 4 කින් සමන්විත ඉතා කුඩා සූරාවකි. මෙය මක්කාවේ පහළ වූ මක්කී සූරාවකි. මෙම සූරාව අල්ලාහ් ඒකයා බවත් සැබෑ දෙවියා ඔහු බවත් තහවුරු කෙරෙන්නේ ය. එබැවින් මෙයට සූරතුල් අහද් සූරතුල් තව්හීද් යන නම් ද ඇත. ඉඛ්ලාස් නැමැති අරාබි වචනයේ අර්ථය පිවිතුරු බව යන්නයි. අල්ලාහ් සියලු ෂිර්ක්වලින් පිවිතුරු වූවෙකි. ඔහුට මව්, පිය, සහෝදර සහෝදරියන් යන කිසිවෙක් නොමැත. එසේ ම කිසිවෙකුගෙන් කිසි දු අවශ්‍යතාවක් අල්ලාහ්ට නොමැත යනුවෙන් මෙම සූරාව කෙටියෙන් විස්තර කරයි. මක්කාවේ ජීවත් වූ කාෆිර්වරුන් නබි(සල්) තුමාණන් වෙත පැමිණ, ඔබ පවසන දෙවියා කෙබඳු පුද්ගලයෙකු දැයි විමසූ විට එයට පිළිතුරු වශයෙන් මෙම සූරාව පහළ විය. (තිර් මිදි) මෙය අල්කුආනයේ තුනෙන් එකකට සමාන යැයි නබි (සල්) තුමාණෝ පැවසූහ. (බුහාරි)

## සූරාව හා එහි අර්ථය




අසීමිත කරුණාවන්ත, අපිරිමිත සෙනෙහෙවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි.)

1 (නබිවරයාණෙනි) මිනිසුන් වෙත ඔබ පවසන්න. අල්ලාහ් ඒකයෙක් පමණි.

2 (එම) අල්ලාහ් (කිසිවෙකුගේ) අවශ්‍යතා නොමැත්තෙකි. (සියල්ල ඔහුගේ දායාදයන් අපේක්ෂා කරන්නේ ය)

3) ඔහු ව (කිසිවෙකු) වැදුවේ නැත. (කිසිවකු විසින් ) වදනු ලැබුවේ ද නැත. (එබැවින් ඔහුට පියෙකු නැත. පරම්පරාවක් ද නොමැත)

4) ඔහුට සමාන කිසිවක් ද නොමැත.

## සූරතුල් ෆලක්

අල්කුර්ආනයේ අන්තර්ගත 113 වන සූරාව වේ. වදන් පහකින් සමන්විත මක්කී සූරාවකි. ෆලක් යන අරාබි පදයේ තේරුම හිමිදිරි උදෑසන යන්නයි. මෙම සූරාව අන්ධකාරයේ හානිවලිනුත් ඊර්ෂ්‍යාකාරයන් හා හූනියම්කරුවන්ගෙන් ආරක්ෂාව පතන අයුරින් සැකසී ඇත.

### සූරාව හා එහි අර්ථය




අසීමිත කරුණාවන්ත, අපිරිමිත සෙනෙහෙවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි.)

1) (නබිවරයාණෙනි, ඔබ ප්‍රාර්ථනා කොට) පවසන්න හිමිදිරියේ නාථයාගෙන් මම ආරක්ෂාව පතමි.

2) ඔහු මැවූ දේවල හානියෙනුත්.

3) (සියල්ල) සැඟවීමට පැතිරී යන අන්ධකාරයේ හානියෙනුත්

4) ගැට ගසා පිඹින (හූනියම් කරන ) කාන්තාවන්ගේ හානියෙනුත්

5) ඊර්ෂ්‍යා කරුවන්, ඊර්ෂ්‍යාකිරීමෙන් ඇති වන හානියෙනුත් (ආරක්ෂාව පතමු)

### සූරතුන් නාස්

අල්කුර්ආන් හි ඇතුළත් 114 වන හා අවසාන සූරාව මෙය වන්නේ ය. වදන් හයකින් සමන්විත මක්කී සූරාව මෙය වේ. නාස් යන අරාබි පදයේ අර්ථය "මිනිසුන්" යන්න ය. මෙම සූරාව නපුරු මිනිසුන් හා ජින්වරුන් මෙන් ම සිතෙහි ඇති වන සැකයන්ගෙන් ද ආරක්ෂාව පතන අයුරින් පවති.

### සූරාව හා එහි අර්ථය



අසීමිත කරුණාවන්ත, අපිරිමිත සෙනෙහෙවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි.)

1) (නබි වරයාණෙනි, ප්‍රාර්ථනා කොට) ඔබ පවසන්න මිනිසුන්ගේ නාථයාගෙන් මම ආරක්ෂාව පතමි.

2) (ඔහු ය) මිනිසුන්ගේ (සැබෑ) රජු.

3) (ඔහු ය) මිනිසුන්ගේ (වැඳීමට සුදුසු සැබෑ) නාථයා.

4) මිනිසුන්ගේ සිත් තුළ (අනවශ්‍ය)සැකයන් ඇතිකොට සැඟවෙන දුර්ගුණ ඇති අයගේ හානියෙනුත් (ආරක්ෂාව පතමි) එවන් දුර්ගුණ ඇත්තෝ ජින්වරුන් අතරත් සිටිති. මිනිසුන් අතරත් සිටිති.

අභ්‍යාස

1) ඉඛ්ලාස් යන්නෙහි අර්ථය කුමක්ද?

2) සූරතුල් ඉඛ්ලාස් අල්කුර්ආනයේ කීවෙනි සූරාව ද?

3) සූරතුල් ඉඛ්ලාස් හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න

4) ෆලක් යන්නෙහි අර්ථය කුමක් ද?

5) සූරතුල් ෆලක් හි අන්තර්ගත වාක්‍ය කීය ද ?

6) නාස් යන්නෙහි අර්ථය කුමක් ද ?

7) අල්කුර්ආනයේ අවසාන සූරාව කුමක් ද?

ක්‍රියාකාරකම

1. ඔබ ඉගෙනගත් සූරාවන් තුන කට පාඩම් කර එහි අර්ථයන් ද කට පාඩම් කරන්න.